# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/10 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2021.08. 09 |
|---|---|---|---|---|---|

දකුණු පළාත් සභාවේ
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/මුදල්/පිරිස් හා පුහුණු/සැලසුම්/ඉංජි.සේවා),
අමාත්‍යාංශ ලේකම්(ප්‍රධාන/ක්‍රීඩා/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර),
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ආයතන ප්‍රධානීන් වෙත,

**Covid – 19 වෛරස් වසංගත තත්වය හමුවේ රාජ්‍ය සේවා යාන්ත්‍රණය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා දුරස්ථ නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම.**

රට තුළ Covid-19 වෛරස් වසංගත ව්‍යාප්තිය ඉහල යාමත් සමග පොදු ප්‍රවාහන ඔස්සේ කාර්යාල වෙත පැමිණෙන නිලධාරීන් විසින් කාර්යාල බස් රථ සේවාව නැවත ආරම්භ කිරීමට මා වෙතින් ඉල්ලීම් කර තිබේ.

02. ඒ අනුව එම ඉල්ලීම් සලකා බලා අත්‍යාවශ්‍ය සේවාවන් ඉටු කිරීම සඳහා දුරස්ථ පෙදෙස් සිට පැමිණෙන නිලධාරීන්හට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා එම බස් රථ සේවාව, 2021.08.09 දින සිට පහත ගමන් මාර්ග ඔස්සේ ආරම්භ කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. එහිදී අනුගමනය කළ යුතු සෞඛ්‍ය රීති හා වැටුපෙන් මාසිකව අයකිරීම සම්බන්ධ උපදෙස් මේ සමග ඉදිරිපත් කරන බවත් ඒ පිළිබඳව සේවාව ලබා ගන්නා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

- ගාල්ල සිට අම්බලන්ගොඩ හරහා ඇල්පිටිය.
- ගාල්ල සිට බද්දේගම.
- ගාල්ල සිට මාතර.
- ගාල්ල - යක්කලමුල්ල (2021.08.16 දින සිට ආරම්භවේ)

**ආර්. සී. ද සොයිසා,**
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත:
1. ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය, දකුණු පළාත.
2. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, දකුණු පළාත.
3. පරිවාස කොමසාරිස්, සමාජසේවා හා පරිවාස දෙපාර්තමේන්තුව.

} ඔබ ආයතනයට අයත් බස් රථ විධිමත් පරිදි මුදල් අයකිරීමේ ක්‍රමවේදය යටතේ යෙදවීම සඳහා


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119010, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.

අනුගමනය කළ යුතු සෞඛ්‍ය රීති.

- සෑම විටම මුඛ ආවරණ පැළඳ සිටිය යුතුය.
- හැකිතාක් සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා රිය සහායක මහතාට හා රියදුරු මහතා හට සහයෝගය ලබා දිය යුතුය.
- නාමලේඛනයෙහි දෛනිකව පැමිණීම සටහන් කිරීම සිදු කළ යුතු අතර, හිතවතුන් බස් රථයට නංවා ගැනීම සිදු නොකළ යුතුය.

වැටුපෙන් අය කිරීම.

- බස් රථ සඳහා ඉන්ධන, එම බස් රථ යොදවනු ලබන ආයතන වෙතින් සපයන අතර, එම පිරිවැය සලකා බලා අදාල නිලධාරීන්ගෙන් වැටුපෙන් අය කිරීම සිදු කරනු ලැබේ.

| අනු අංකය | මාර්ගය | බස් රථය | රියදුරු/ රියසහායක | ගමන් ආරම්භක වේලාව | මාසිකව අයවිය යුතු මුදල |
|---|---|---|---|---|---|
| 01 | ගාල්ල අම්බලන්ගොඩ හරහා ඇල්පිටිය | NA-6087 (ප්‍රධාන ලේකම් කාර්යාලය) | ජයවීර මයා (0771745413)<br>චාමර මයා (0773102800) | ඇල්පිටියෙන් පෙ.ව. 6.50<br>අම්බලන්ගොඩින් පෙ.ව. 7.20<br>සවස දක්ෂිණපායෙන් ප.ව. 4.25 | රු.1850.00 |
| 02 | ගාල්ල - මාතර | NC-8361 (ක්‍රීඩා අමාත්‍යාංශය) | ලෙස්ලි මයා (0768176559)<br>සමන්ත මයා (0776107305) | මාතරින් පෙ.ව. 7.00<br>සවස දක්ෂිණපායෙන් ප.ව. 4.25 | රු.1700.00 |
| 03 | ගාල්ල - බද්දේගම | NC-2259 (අධ්‍යාපන අමාත්‍යාංශය) | හේමන්ත මයා (0771523165)<br>ක්‍රිශාන්ත මයා (0764118058 0712307318) | බද්දේගමින් පෙ.ව. 7.20<br>සවස දක්ෂිණපායෙන් ප.ව. 4.25 | රු.450.00 |
| 04 | ගාල්ල - යක්කලමුල්ල (2021.08.16 දින සිට ආරම්භවේ | NC-7863 (පරිවාස දෙපාර්තමේන්තුව | කපිල මයා (0740608718) | යක්කලමුල්ලෙන් පෙ.ව. 7.40<br>ගාල්ලෙන් ප.ව. 4.20 | රු. 800.00 |